// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2287/25 - 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### දුම්රිය ආඥාපනත

දුම්රිය ආඥාපනතේ (200 පරිච්ඡේදයේ) 03 හා 04 ඒ යන වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පනවා ඇති ව්‍යවස්ථාව.

**ආචාර්ය බන්දුල ගුණවර්ධන,**
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍ය.

2022 ජූනි මස 21 වැනි දින,
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ දී ය.

ව්‍යවස්ථාව

1926 පෙබරවාරි මස 26 වැනි දින අංක 7514 දරන *ගැසට්* පත්‍රයේ අතිරේකයෙහි පළකරන ලද හා වරින්වර සංශෝධනය කරන ලද මඟී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය සහ ගාස්තු සහ බඩු වර්ගීකරණය පිළිබඳ රෙගුලාසි 2022 ජූලි 12 වැනි දින සිට තවදුරටත් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

"මගීන් යන ශීර්ෂය යටතේ"
17 වන රෙගුලාසිය - ගාස්තු

අතුරු ඡේදය -
(ඒ) - සෑම දුම්රිය ස්ථානයක, උප දුම්රිය ස්ථානයක, දුම්රිය නැවතුම්පොලක සිට වෙනත් දුම්රිය ස්ථානයක්, උප දුම්රිය ස්ථානයක් හෝ දුම්රිය නැවතුම්පොලක් දක්වා ගාස්තුව සඳහන් කර ඇති කලාප චක්‍රයට අනුකූලව පහත පරිදි සංශෝධනය කෙරේ.

1A - G 37046 — 81 (2022/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

| ඕනෑම ආරම්භක දුම්රිය/ උප දුම්රිය ස්ථානයක සිට | මගී. කි. මී. 1ට ගාස්තුව රු. | | |
|---|---|---|---|
| | I පන්තිය | II පන්තිය | III පන්තිය |
| 1 කලාපය කි. මී. 0 සිට කි. මී. 10 දක්වා | 10.40 | 5.20 | 2.60 |
| 2. කලාපය කි. මී. 10+ සිට කි. මී. 50 දක්වා | 9.60 | 4.80 | 2.40 |
| 3. කලාපය කි. මී. 50+ සිට කි. මී. 100 දක්වා | 6.80 | 3.40 | 1.70 |
| 4. කලාපය කි. මී. 100+ සිට කි. මී. 200 දක්වා | 5.60 | 2.80 | 1.40 |
| 5. කලාපය කි. මී. 200 සිට ඔබ්බට | 4.40 | 2.20 | 1.10 |
| අවම ගාස්තුව | 100.00 | 50.00 | 20.00 |
| වැටයීම ඉහළ රුපියල් - | 50.00 | 50.00 | 20.00 |

(බී) - වේදිකා ප්‍රවේශපත්‍ර ගාස්තුව රුපියල් 20.00ක් වේ.

**බඩු ප්‍රවාහනය කිරීම**

**රෙගුලාසි 10 (ඒ) (i)**

පැට්‍රෝලියම් නිෂ්පාදන ප්‍රවාහනය
පවත්නා ගාස්තු ලොප් කර පහත සඳහන් ගාස්තු ආදේශ කරන්න.

| | *ලීටර 1,000ක් කි. මී. 01ක් ප්‍රවාහනයට* | |
|---|---|---|
| | *රඹුක්කනින් පහළ රු. ශත* | *රඹුක්කනින් ඉහළ රු. ශත* |
| 1 අහස් යානා ස්ප්‍රීතු | 17.40 | - |
| 2. ගැසලින්/භූමිතෙල්/පෙට්‍රල්ඩීසල්/ගෑස්තෙල්/ කළුතෙල්/උදුන් තෙල් | 14.60 | 17.40 |

**රෙගුලාසි 10 (ඒ) - (ii)**

විවිධ දුම්රිය ස්ථානයන් සඳහා මෙම ගාස්තු චක්‍රය භාවිත කර ගාස්තු ගණනයේ දී එක් එක් ඉන්ධන ටැංකිය සඳහා ලැබෙන ප්‍රවාහන ගාස්තුව ආසන්න ඉහළ රු. 1,000.00ට වැටයීම සිදු කළ යුතු වේ.

**රෙගුලාසි 10** - ගාස්තු ක්‍රමය සරල කිරීම සඳහා ෂන්ටින් ගාස්තු හා හිස් ධාවන ගාස්තු ද ඇතුළත් 1 හා 2 පන්ති සඳහා නව ගාස්තු හා කොන්දේසි ආදේශ කරන්න.

**රෙගුලාසි 10 (ඒ) - *(i)***
බඩු පටවන/භාර ගන්නා ස්ථානවල ෂන්ටින් හා ස්ථාන ගත කිරීම් වැනි අනියම් ගාස්තු හා හිස් ධාවන ගාස්තු ඇතුළත්ව පහත නව ගාස්තු අය කළ යුතු වේ.

පවත්නා ගාස්තු ලොප් කර යෝජිත ගාස්තු ආදේශ කරන්න.

| | *මෙ. ටොන්/කිලෝමීටරයකට* | |
|---|---|---|
| | *රඹුක්කනින් පහළ රු. ශත* | *රඹුක්කනින් ඉහළ රු. ශත* |
| 1 වැනි පන්තිය | 9.00 | 13.00 |
| 2 වැනි පන්තිය | 11.00 | 14.50 |

**රෙගුලාසි 10 (ඒ) - (i)**

විවිධ දුම්රිය ස්ථානයන් සඳහා මෙම ගාස්තු චක්‍රය පිළියෙල කිරීම පිණිස ගාස්තු ගණනයේ දී ලැබෙන ගාස්තුව ඊළඟ සම්පූර්ණ ඉහල රුපියල් සියය සඳහා රවුම් කර පිළියෙළ යුතු වේ.

**රෙගුලාසි 11** - අවම හා කොටස් සඳහා ගාස්තු අය කිරීම.

11 (ඒ) - බඩු ප්‍රවාහනය සඳහා ගණන් බැලීමේ දී අවම දුර කි. මී. 100ක් වනු ඇත.
11(බී) - වැගන් සඳහා අවම ගාස්තු ගණන් බැලීම.
11(බී) (i) - පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 13.20 නොඉක්මවන රෝද හතරේ වැගනයක් සඳහා රු. 3,000.00
11(බී) (ii) - පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 13.20 නොඉක්මවන රෝද හතරේ වැගනයක් සඳහා රු. 4,000.00
11(බී) (iii) - පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 13.20 නොඉක්මවන රෝද හතරේ වැගනයක් සඳහා රු. 5,000.00
11(බී) (iv) - පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 13.20 නොඉක්මවන රෝද හතරේ වැගනයක් සඳහා රු. 6,000.00

**රෙගුලාසි 11 (සී)**

i. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 13.20 නොඉක්මවන රෝද හතරේ වැගනයක් සඳහා අවම බර මෙ. ටොන් 10ක් ද,
ii. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 26.40 නොඉක්මවන රෝද අටේ වැගනයක් සඳහා අවම බර මෙ. ටොන් 20ක් ද,
iii. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 26.40 ඉක්මවන එහෙත් මෙ/ටොන් 39.60 නොඉක්මවන රෝද අටේ වැගනයක් සඳහා මෙ. ටොන්. 25 ක් ද,
iv. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 39.60 ඉක්මවන රෝද අටේ වැගනයක් සඳහා අවම බර මෙ. ටොන්. 35 ක් ද වේ.

**රෙගුලාසි 23** - වැගන් සඳහා ප්‍රමාද ගාස්තු

**රෙගුලාසි 23 (ඒ)**
සෑම දුම්රිය ස්ථානයකදීම වැගන් සපයා පැය 8ක් ඇතුළත ඒවාට බඩු පටවා නිම කළ යුතු ය. වැගන් ඇණවුම්කරු නියමිත කාලය ඇතුළත ඒවාට බඩු පැටවීමට අපොහොසත්වන හෝ, බඩු පැටවුව ද, වාර්ණාපත්‍ර ඉදිරිපත් කිරීමට අපොහොසත්වන බඩු යවන්නා එකී ප්‍රමාදයන් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට බැඳී සිටින අතර වැඩකරන පැයකට හෝ ඉන් කොටසකට රෝද හතරේ හෝ රෝද අටේ වැගනයක් සඳහා රු. 2,500.00 බැගින් ගෙවිය යුතු ය.

**රෙගුලාසි 13 (ඒ)** - තැපැල් ප්‍රවාහනය

| | *රඹුක්කනින් පහළ කිලෝමීටරයකට රු.* | *රඹුක්කනින් ඉහළ කිලෝමීටරයකට රු.* |
|---|---|---|
| ජංගම තැපැල් මැදිරිය | 175.00 | 225.00 |
| තිරිංග මැදිරියෙන් අඩක් | 110.00 | 200.00 |
| නියාමක භාරයේ තැපැල් | 100.00 | 125.00 |
| තැපැල් ප්‍රවාහනය කරන බෝගී ආවරණ වැගනයක් | 125.00 | 200.00 |
| රෝද හතරේ වැගනයක් | 100.00 | 150.00 |

සටහන - 11 වැනි රෙගුලාසියේ දක්වා ඇති අවම ගාස්තු තැපැල් ප්‍රවාහන වැගන්වලට ද අදාළ වේ.

EOG 07 - 0031

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.